**ශීර්ෂය 219 – ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

---

ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 දෙසැම්බර් 22 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂාකිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,811.70 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 2,013.47 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 798.23 ක් හෙවත් සියයට 28.39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 727.30 | 706.84 | 20.46 | 2.81 |
| මූලධන | 2,084.40 | 1,306.63 | 777.77 | 37.31 |
| එකතුව | 2,811.70 | 2,013.47 | 798.23 | 28.39 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11.00 | 10.69 | 6.00 | 8.41 | 32.00 | 30.08 |

## 2.3 අග්‍රිම ගිණුම්

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0301/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.12,910 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 6000/0000/00/0016/0088/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 176.81 ක් විය.

## 2.5 විගණන නිරීක්ෂණය

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් බැරකම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර පහත දැක්වෙන අනෙකුත් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛන | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) |
| (iv) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (v) බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

### 3.2 විසර්ජන ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.3,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයන් 05 ක් සහ මූලධන වැය විෂයන් 04 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය, එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 74 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.3 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 83 ක් වූ තැන්පතු 123 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2014 අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 75 ක කොන්ත්‍රාත් තැන්පතුවලට අදාළව ආයතනයේ නම පමණක් කෙටියෙන් සඳහන් කර තිබුණ අතර, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 569(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------------

විෂය අංක 21901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,715,710 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය අතර රු.548,538 ක වෙනසක් නිරීක්ෂණය විය.

**3.5 වත්කම් කළමනාකරණය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවත්වීම**

**--------------------------------------**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2017 ජූලි 31 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ඇති ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන 17 ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

ක්‍රීඩා කෞශල්‍යා වැඩසටහනේ සමාරම්භක වැඩසටහන සඳහා හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා පුද්ගලික ආයතනයකින් එකක් රු. 777 බැගින් ටී ෂර්ට් 2,000 ක් රු.1,554,000 කට දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් මෙලෙස මිලදීගත් ටී ෂර්ට්වලින් රු.1,160,838 ක් වටිනා ටී ෂර්ට් 1,494 ක ප්‍රමාණයක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් බෙදා නොහැර ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

**3.6 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති , රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 751 | දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම භාණ්ඩ, බඩු ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවද රු.180,000 ක් වටිනා දැල්පන්දු කණු දෙක ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු රජයේ නිලධාරීන් ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | දෙපාර්තමේන්තුව සතු සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා නියමිත කාලවකවානුව තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.2.11 ඡේදය | සෑම මාස 06 කදීම වාහනවල ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වූවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 මැයි 15 දිනැති අංක මු.අ.01/2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 07 (අ) ඡේදය | විදේශගත වීමකට අදාළව දීමනාවක් හෝ වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා ගෙවීම් කරනු ලබන අවස්ථාවේදී එය වියදමක් වශයෙන් ගිණුම් ගත කළ යුතුය. එසේ වුවද 2016 වර්ෂයේදී 12 වන ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගී වූ නිලධාරීන් විදේශගත වීම වෙනුවෙන් වූ රු.4,811,042 ක් ගෙවීම සමාලෝචිත වර්ෂයට ගිණුම්ගත නොකර 2017 වර්ෂයේ ගිණුම්වලට ඇතුළත් කර තිබුණි. |

## 3.7 කාර්යසාධනය

(අ) 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් පරිදි ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවති ව්‍යාපෘති හා එහි ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.මිලියන 1,348 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘති 74 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් ව්‍යාපෘති 54 ක් පමණක් නිමකළ තිබූ අතර ව්‍යාපෘති 20 ක වැඩ අවසන් කර නොතිබුණි.

(ii) ක්‍රීඩා ශක්ති වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු.මිලියන 60 ක් සලසා ගෙන දිස්ත්‍රික්, පළාත් සහ ජාතික සංචිත ඇති කිරීමට සැලසුම් කර තිබුණි. 2016 වර්ෂය තුළදී රු.මිලියන 7.5 ක මුදලක් වැයකර දිස්ත්‍රික් ක්‍රීඩා සංචිත 48 ක් පමණක් පිහිටුවා තිබුණි. ඉතිරි මුදල අරමුණුගත කාර්යයෙන් බැහැරව ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා වියදම් කර තිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අවස්ථා පැවති අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) 2011 ජුලි 06 දිනැති අංක 2011/14 දරන “ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම” මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ශ්‍රී ලංකාවේ පළාත් නවය තුළ අංග සම්පූර්ණ ක්‍රීඩා පහසුකම්වලින් සමන්විත ක්‍රීඩා සංකීර්ණ 09 ක් 2013 – 2014 කාලය තුළ ඉදිකිරීමේ අරමුණ ළඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) 2011 වර්ෂයේදී පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාත් ක්‍රීඩා සංකීර්ණය අනුරාධපුර නගරයේත්, උතුරු පළාත් ක්‍රීඩා සංකීර්ණය කිලිනොච්චි නගරයේත් ඉදිකිරීමට පිළිවෙලින් රු.මිලියන 172 ක් හා රු.මිලියන 324 කට ඇස්තමේන්තු කර තිබුණි. උතුරු මැද පළාත් ක්‍රීඩා සංකීර්ණයේ රු. මිලියන 50 ක ඇස්තමේන්තු ගත ප්‍රේක්ෂකාගාරය වෙනුවෙන් පමණක් රු. මිලියන 124 ක් වැය කර තිබුණි. ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා පළාත් ක්‍රීඩා සංකීර්ණ දෙකෙහි ප්‍රතිපාදන මුදල් ඒකාබද්ධ කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. අනුරාධපුර ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණත් ප්‍රතිපාදනයන් නොමැති වීම හේතුවෙන් කිලිනොච්චිය ක්‍රීඩාංගනයේ ක්‍රීඩා පිටිය හා ක්‍රිකට් ක්‍රීඩා පිටිය ඉදිකිරීමට නොහැකි වී තිබුණි.

**3.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

------------------------------------

**ගැලපුම් කළ යුතු ශේෂ**

----------------------

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව එසේ ගැලපුම් කළ යුතු ගනුදෙනු පිළිබඳව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

(අ) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ රු.66,764 ක් වූ චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුමට බැර වී තිබූ රු.912,395 ක් වූ හඳුනා නොගත් ලැබීම් සහ බැංකු ගිණුමට හර වී තිබූ රු.903,769 ක් වූ හඳුනා නොගත් ගෙවීම්, සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගෙන ගිණුම්වල ගැලපීම සඳහා ක්‍රියා කර නොතිබුණි.

**3.9 අනාර්ථික ගනුදෙනු**

-----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ඉන්දියාවේ පැවති 12 වන දකුණු ආසියානු තරඟාවලිය සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 477 දෙනෙකු සමඟ නිලධාරීන් 288 දෙනෙකු සහභාගී වී තිබුණි. කෙසේ වුවද, ජාතික ඔලිම්පික් කමිටු මහ ලේකම්ගේ 2016 මාර්තු 18 දිනැති ලිපිය මඟින් මෙම ක්‍රීඩා උළෙල සඳහා සහභාගී කරවිය යුතු නිලධාරීන් ගණන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් සියයට 30 ක් විය යුතු බව දන්වා තිබුණි. ඒ අනුව උපරිම වශයෙන් නිලධාරීන් 143 දෙනෙකු පමණක් සහභාගී විය යුතු වුවද මුළු නිලධාරීන් 228 දෙනෙකු ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වී තිබීම හේතුවෙන් ඉහත ලිපියට පටහැනිව නිලධාරින් 145 ක් ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ඉන්දියාවේ 2016 පෙබරවාරි මාසයේදී පැවති 12 වන දකුණු ආසියානු තරඟාවලිය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව වෙත ලබා දුන් මුදලින් ඉතිරි වූ රු. 6,878,916 ක් 2018 මාර්තු 31 දින වන විටත් දෙපාර්තමේන්තුවට ආපසු ලබා දී නොතිබුණි.

**3.10 අවිධිමත් ගනුදෙනු**

-------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම**

-------------------------------------------------------------

(අ) ක්‍රීඩා කෞශල්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මිලදී ගත් උපකරණ හා ටීෂර්ට් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ විරාම සටිකා 942 ක් මිලදී ගැනීම සඳහා එකක් රු.3,750 කට අවම මිල ඉදිරිපත් වූ සැපයුම්කරුට විරාම සටිකා සපයන ලෙස දන්වා තිබුණි. එසේ වුවද, සැපයුම්කරු විසින් විරාම සටිකා 908 ක් එකක් රු.9,500 බැගින් සපයා තිබූ අතර ඒ වෙනුවෙන් 2016 දෙසැම්බර් 30 දින රු.8,626,000 ක් ගෙවා තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු.5,221,000 ක අලාභයක් සිදු වී තිබුණි.

(ii) ක්‍රීඩා කෞශල්‍ය පුහුණු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව එක් පුහුණු මධ්‍යස්ථානයකට ලයිට් මීසයිල 6 බැගින් පුහුණු මධ්‍යස්ථාන 314 ක් සඳහා ලයිට් මීසයිල 1884 ක් මිලදි ගැනීමට සැලසුම් කර තිබුණි. ඒ සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකු ඉදිරිපත් වී තිබුණ අතර පළමු සැපයුම්කරු සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී නොතිබුණි. එසේ වුවත් එම සැපයුම්කරුවන් දෙදෙනාටම ගැණුම් ඇනවුම් නිකුත් කර තිබීම හේතුවෙන් පළමු සැපයුම්කරු රු.4,950 බැගින් 1872 ක් ද දෙවන සැපයුම්කරු විසින් රු.2,270 බැගින් 1884 ක් ද ලයිට් මීසයිල සපයා තිබුණි. ලයිට් මීසයිල රු.4,950 බැගින් සැපයූ සැපයුම්කරුට 2018 මාර්තු 31 වන විටත් කිසිඳු ගෙවීමක් සිදුකර නොතිබූ අතර එසේම එම මීසයිල 1872 ක 2018 මාර්තු 31 දින වනවිටත් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(iii) ක්‍රීඩා කෞශල්‍ය ව්‍යාපෘතිය සඳහා එකතුව රු. 53,488,234 ක් වූ ක්‍රීඩා උපකරණ අයිතම 15 ක් මිලදී ගැනීමේදි පහත සඳහන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම් නිරීක්ෂණය විය.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) මාර්ගෝපදේශය පරිදි ක්‍රීඩා කෞශල්‍ය ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් භාණ්ඩ වර්ග 15 සඳහා සුදුසු හා ප්‍රමාණවත් පිරිවිතර තීරණය කර නොතිබුණි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (ඊ) මාර්ගෝපදේශය පරිදි තාක්ෂණික කමිටු ඇගයීම් වාර්තාව සහ නිර්දේශයන් සමාලෝචනය කිරීමෙන් පසු සැපයුම්කරු තෝරාගත යුතු වුවද රු.8,626,000ක් වටිනා විරාම සටිකා සහ රු.9,266,400 ක් වටිනා ලයිට් මිසයිල මිලදී ගැනීමේදී තාක්ෂණික කමිටු නිර්දේශයන් ලබා ගැනීමට ප්‍රථම ප්‍රසම්පාදන කමිටු විසින් සැපයුම්කරු තෝරාගෙන තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් කළ යුතු වුවද ගෙවීම් වවුචර් 18 ක් මඟින් සිදුකළ රු.26,812,548 ක් වටිනා මිලදී ගැනීම් ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් වී නොතිබුණි.

**3.11 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

ටොරින්ටන් පිහිටි දැල් පන්දු ක්‍රීඩා පිටිය ඉදි කිරීමේ කර්මාන්තය සඳහා විවෘත ලංසු කැඳවීමක් මගින් කොන්ත්‍රාත්කරු තෝරාගෙන නොතිබුණි. මහනගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම මගින් එම කටයුත්ත ඉටු කරවා ගැනීම සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු. මිලියන 22.8 ට අමතරව තවත් රු.මිලියන 8.3 ක් වැය කර තිබුණි. මෙම ඉදිකිරීම එය ජාත්‍යන්තර නෙට්බෝල් නීතියට අනුකූල වූ පිරිවිතරයන්ගෙන් බැහැරව සිදුකර තිබුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 09 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 23 | 22 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 234 | 168 | 66 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 42 | 10 | |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | එකතුව | 324 | 243 | 83 | 02 |